**ශ්‍රී ජයවර්ධනපුර කලාප අධ්‍යාපන කාර්යාලය**

**ප්‍රථම වාර පරීක්ෂණය- 2019**

**10 ශ්‍රේණිය**

**භූගෝල විද්‍යාව I කොටස**

කාලය පැය 3

- **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත ය.**
- **එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුව සියලුම ප්‍රශ්න වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 10 දක්වා ඇති ප්‍රශ්න වල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.**

1. පෘථිවිය මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර මිලියන ................. ක් පමණ වන විශාල පද්ධතියකි. (1200/510/1000)
2. ප්‍රභාසංස්ලේෂණය සඳහා අවශ්‍ය ................ වායුව සැපයීම නිසා ශාකවල පැවැත්මට වායුගෝලය ඉතා වැදගත් වේ. (නයිට්‍රජන් / ඔක්සිජන් /කාබන්ඩයොක්සයිඩ්)
3. සුපර්සොනික් ජෙට් යානා පියාසර කරන්නේ ........................ මධ්‍යම කලාපය තුළ ය. (පරිවර්තීගෝලයේ / අපවර්තීගෝලයේ / මෙසෝගෝලයේ )
4. වර්ෂණය මගින් පෘථිවිය මතට ලැබෙන ජලයෙන් භූමිය තුළට කාන්දු වන ජලය ............. ජලය ලෙස ගබඩා වේ. (භූතල / උල්පත් / භූගත)
5. පෘථිවියේ මහද්වීපික කබොල ........................... පාෂාණ වලින් සමන්විතය. (බැසෝල් ග්‍රැනයිට් / විපරීත)
6. ප්‍රාවරණය සහ හරය වෙන් කරන සීමාව .............................. අසන්තතිය නමින් හැඳින්වේ. (ගුටෙන්බර්ග් / මෙහොරෝවිසික් / කොන්රඩ්)
7. හිමාලයා කඳු පන්තියේ ඇති ............................... සානුව මුහුදු මට්ටමේ සිට උසින් ම පිහිටි සානුවයි. (බ්‍රසීලියානු / ටිබෙට් / පාමීර්)
8. ............................ මුහුද සම්පූර්ණයෙන් ම ගොඩබිමෙන් වට වූ මුහුදකි. (මධ්‍යධරණී / ජපන් / කැස්පියන්)
9. දීර්ඝ කාලයක් තුළ පවත්නා වායුගෝලීය සාමාන්‍ය තත්ත්වය ........................... නම් වේ. (දේශගුණය / කාලගුණය / පීඩනය)
10. කර්කටක නිවර්තනයත් මකර නිවර්තනයත් අතර කලාපය............................ දේශගුණ කලාපලෙස හැඳින්වේ. ( සමක/නිවර්තන/මකර )

- **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

11. උන්නතාංශය සමග උෂ්ණත්වය අඩු වී යාම පරිවර්ති ගෝලයේ විශේෂ ලක්ෂණයකි. (නි / වැ)
12. පෘථිවියේ මහද්වීපික කබොල ග්‍රැනයිට් පාෂාණ වලින් සමන්විත ය. (නි /වැ)
13. පෘථිවියේ මුළු භූමි ප්‍රමාණයෙන් 29% ක් සාගර වලින් සමන්විත ය. (නි / වැ)
14. ආසියා මහද්වීපික තටකය තුළ පැපුවා නිව්ගිනියා දූපත පිහිටා ඇත. (නි / වැ)
15. සුපීරියන් විල ලෝකයේ විශාලතම විලයි. (නි / වැ)

- **අංක 16 සිට 25 තෙක් ප්‍රශ්නවල හිස්තැන් වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

16. පෘථිවියේ කබොල හා ප්‍රාවරණයේ ඉහළ කොටස ඇතුලත් කලාපය ................. ලෙස හැඳින්වේ.
17. අභ්‍යාවකාශයේ සිට පෘථිවිය දෙසට පතිත වන උල්කාෂ්ම බොහොමයක් ................ දී දැවී විනාශ වේ.
18. පෘථිවියේ ශාක, සත්ත්ව හා ක්ෂුද්‍රජීවීන් වාසය කරන ස්තරය ........................ ගෝලය ලෙස හැඳින්වේ.
19. පෘථිවි ව්‍යුහය ප්‍රධාන ස්තර ............. සමන්විත ය.
20. ශිලාගෝලයේ විශාල භූ තැටි .......................... සහ කුඩා භූ තැටි කිහිපයකින් සමන්විත වේ.
21. මරියානා අගාධය ඇතුලු අගාධ බොහොමයක් .............................. සාගරයේ පිහිටා තිබේ.
22. .............................. දේශගුණ කලාපයේ පැහැදිලි උණුසුම් සෘතුවක් සහ වර්ෂාපතනය සහිත ශීත සෘතුවක් දක්නට ලැබේ.
23. ශ්‍රී ලංකාව අයත් වන්නේ නිවර්තන කලාපයේ .......................... දේශගුණයට ය.
24. භෞතික ලක්ෂණ හා සංස්කෘතික ලක්ෂණ අතර අන්තර් සම්බන්ධතාවය අවබෝධ කර ගැනීමට ........................... සිතියම් ප්‍රයෝජනවත් වේ.
25. ඇල්ප්ස් කඳු .................. මහද්වීපයේ පිහිටා ඇත.

papers.lk

- **අංක 26 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්න වල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු 2 ක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරු වල අනුපිළිවෙළට අනුව 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉරමත ලියන්න.**

26.

| 'අ' | | 'ආ' | |
|---|---|---|---|
| දූපත | | පිහිටා ඇති භූ තැටිය | |
| i) | මැඩගස්කරය | A) | උතුරු ඇමරිකානු |
| ii) | බ්‍රිතාන්‍ය දූපත් | B) | අප්‍රිකානු |
| iii) | කියුබාව | C) | ඉන්දු ඕස්ට්‍රේලියානු |
| | | D) | යුරේසියානු |

(1) ABC (2) BDA (3) CAB (4) DCB (................)

27.

| 'අ' | | 'ආ' | |
|---|---|---|---|
| පෘථිවි ව්‍යුහයේ ස්තර | | පාෂාණ සංයුතිය | |
| i) | කබොල | A) | නිකල් හා යකඩ |
| ii) | පහළ ප්‍රාවරණය | B) | සිලිකේට් හා ඛනිජ |
| iii) | පිටත හරය | C) | ග්‍රැනයිට් හා බැසෝල්ට් |
| | | D) | යකඩ හා මැග්නීසියම් |

(1) ABC (2) BCD (3) CDA (4) DBA (................)

28.

| 'අ' | | 'ආ' | |
|---|---|---|---|
| ප්‍රධාන සාගරය | | පිහිටා ඇති මුහුද | |
| i) | අත්ලන්තික් සාගරය | A) | කහ මුහුද |
| ii) | ඉන්දියන් සාගරය | B) | කැරිබියන් මුහුද |
| iii) | පැසිපික් සාගරය | C) | අන්දමන් ද මුද |
| | | D) | සුදු මුහුද |

(1) BCA (2) BCD (3) CDA (4) DBC (................)

29.

| 'අ' | | 'ආ' | |
|---|---|---|---|
| රට | | පිහිටි ගඟ | |
| i) | බ්‍රසීලය | A) | හොවැංහෝ |
| ii) | ඇමරිකා එක්සත් ජනපදය | B) | ගංගානම් ගඟ |
| iii) | ඉන්දියාව | C) | මිසිසිපි ගඟ |
| | | D) | ඇමසන් ගඟ |

(1) ABC (2) BCA (3) ACD (4) DCB (................)

30.

| 'අ' | | 'ආ' | |
|---|---|---|---|
| ගංගාව | | ගංගාවේ ආරම්භය | |
| i) | නයිල් ගඟ | A) | විලකින් |
| ii) | තේම්ස් ගඟ | B) | උල්පතකින් |
| iii) | රයින් ගඟ | C) | කඳුකර ප්‍රදේශයකින් |
| | | D) | ග්ලැසියර දිය වූ ජලයෙන් |

(1) ABD (2) ABC (3) BCD (4) DCB (................)

- **ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයකට දී ඇති පිළිතුරු හතර අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

31. ජීවීන්ගේ ශ්වසනයට හා ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය වායූන් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ, (.....)

(1) ඔක්සිජන් හා නයිට්‍රජන් ය. (2) ඔක්සිජන් හා කාබන්ඩයොක්සයිඩ් ය.

(3) නයිට්‍රජන් හා ඔක්සිජන් ය. (4) නයිට්‍රජන් හා කාබන්ඩයොක්සයිඩ් ය.

papers.lk

32. වායුගෝලයේ වැඩිම පරිමාවක් සමන්විත වායු වර්ගය කුමක් ද? (.....)
(1) ඔක්සිජන් (2) කාබන්ඩයොක්සයිඩ් (3) නයිට්‍රජන් (4) මීතේන්

33. වර්ෂණය, උෂ්ණත්වය, පීඩනය, සුළං ආර්ද්‍රතාවය, වලාකුළු වර්ධනය වැනි සියලු කාලගුණික සංසිද්ධීන් සිදුවන ස්ථරය වන්නේ, (.....)
(1) පරිවර්ති ගෝලය යි. (2) අපවර්ති ගොලය යි.
(3) මෙසෝ ගෝලය යි. (4) තාප ගෝලය යි.

34. ජෛවී සාධක පමණක් ඇතුලත් පිළිතුර වන්නේ, (.....)
(1) ජලය, ශාක හා සතුන් ය. (3) පස, ජලය හා වාතය යි.
(2) ශාක, සතුන් හා වියෝජකයින් ය. (4) ශාක, ජලය හා පස ය.

35. පෘථිවි ගෝලයේ ආනතිය සඳහන් නිවැරදි පිළිතුර වන්නේ, (.....)
(1) $18\frac{1}{2}^{0}$ යි (2) $23\frac{1}{2}^{0}$ යි (3) $25\frac{1}{2}^{0}$ යි (4) $33\frac{1}{2}^{0}$ යි

36. ලොව විශාලතම ජල පරිමාවක් හිමි ගංගාවකි, (.....)
(1) නයිල් (2) යැංසියකියෑං (3) මරේඩාලින් (4) ඇමසන්

37. පංච මහා විල් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න. (.....)
(1) සුපීරියන්, මිචිගන්, හියුරන්, ඊරි, ඔන්ටේරියෝ
(2) සුපීරියන්, ලැඩෝගා, හියුරන්, ඊරි, අයර්
(3) සුපීරියර්, වික්ටෝරියා, මලාවි, චැඩ්, ඊරි
(4) සුපීරියර්, මිචිගන්, ලැඩෝගා, චැඩ්, හියුරන්

38. ජෛව ගෝලයේ පැවැත්මට බලපාන ඕසෝන් ස්ථරය පිහිටා ඇත්තේ, (.....)
(1) පරිවර්ති ගෝලයේ ය (2) පරිවර්ති මණ්ඩලයේ ය
(3) අපවර්ති ගෝලයේ ය (4) මෙසෝ ගෝලයේ ය

39. ශීත දේශගුණික කලාපයේ ඇති විශේෂ දේශගුණයක් වන්නේ, (.....)
(1) ඇමසන් දේශගුණයයි (2) මධ්‍යධරණී දේශගුණයයි
(3) නිවර්තන දේශගුණයයි (4) තුන්ද්‍රා දේශගුණයයි

40. ශ්‍රී ලංකාවේ වැඩි ම දිග පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා ය. එම දිග වන්නේ, (.....)
(1) 432 km කි (2) 224 km කි (3) 520 km කි (4) 448 km කි

papers.lk

**ප්‍රථම වාර පරීක්ෂණය- 2019**

**10 ශ්‍රේණිය**

**භූගෝල විද්‍යාව II කොටස**

- මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකි.
- I කොටසේ ප්‍රශ්න අනිවාර්ය වේ. එහි (අ), (ආ) හා (ඉ) කොටස් තුනට ම පිළිතුරු සපයන්න.
- II කොටසින් ප්‍රශ්න <u>හතරකට</u> පිළිතුරු සපයන්න.

**I කොටස**

01. (අ) (1) තේමා සිතියම් යනු කුමක්ද? (ල:2)

(2) භූ ලක්ෂණ සිතියම් වල ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල:2)

(3) ශ්‍රී ලංකාවේ 1:50000 සිතියම් කොටස් 92 කි. එක් සිතියම් කොටසක දිග හා පළල කිලෝමීටර් වලින් ලියන්න. (ල:2)

(4) 1:50000 භූ ලක්ෂණ සිතියමක අන්තර්ගත තොරතුරු බෙදා දැක්වෙන කොටස් දෙක නම් කරන්න. (ල:2)

(5) අක්ෂාංශ හා දේශාංශ අනුව ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ පිහිටීම ලියා දක්වන්න. (ල:2)

(ආ) ලෝක සිතියම ඇසුරෙන් පිළිතුරු සපයන්න.




(1) A,B, හා C අතරින් තායිවානය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(2) D, E හා F අක්ෂර වලින් ඇල්ප්ස් කඳුවැටිය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(3) G, H හා J අක්ෂර වලින් අරාබි මුහුද දැක්වෙන අක්ෂරය කුමක්ද?

(4) K, L හා N අක්ෂර වලින් රොකී කඳුවැටිය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(5) P, Q හා R අක්ෂර වලින් කැස්බියන් මුහුද දැක්වෙන අක්ෂරය කුමක්ද?




(ඉ)

(1) A,B හා C අතරින් පොළොන්නරු දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(2) D,E හා F අක්ෂර අතරින් ඌව පළාතට අයත් දිස්ත්‍රික්කය කුමක්ද?

papers.lk

(3) G,H හා I අක්ෂර වලින් දෙවුන්දරතුඩුව අයත් දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක්ද?

(4) සිතියමේ K,L හා M අක්ෂර අතරින් දඹුල්ල අයත් දිස්ත්‍රික්කය කුමක්ද?

(5) P,Q හා R අක්ෂර අතුරින් කැළණි ගඟ දැක්වෙන අක්ෂරය කුමක්ද?

## II කොටස

02. (1) පෘථිවියේ කරදිය ජල ව්‍යාප්තියේ ප්‍රතිශතය කොපමණද? (ල:2)

(2) පෘථිවියේ ජල ගෝලයේ අන්තර්ගත ජලය පවත්නා ස්වරූප තුන ලියන්න. (ල:3)

(3) (a) ජෛවගෝලය යනු කුමක්ද? (ල:2)

(b) ජෛව ගෝලයේ සීමාවන් ලියා දක්වන්න. (ල:3)

03. (1) පාෂාණ වල ඝනත්වය, සංයුතිය සහ පිහිටීම අනුව කබොල බෙදෙන කොටස් දෙක නම් කරන්න. (ල:2)

(2) පෘථිවියේ ව්‍යුහයේ හරස්කඩක් ඇඳ එහි ප්‍රධාන ස්තර තුන ලකුණු කර නම් කරන්න. (ල:3)

(3) එහි එක් ස්තරයක ලක්ෂණ පැහැදිලි කරන්න. (ල:5)

04. මහද්වීපික මායිම් සිතියමක් මෙහි දැක්වේ.




(1) (a) A අක්ෂරය සඳහන් ස්ථානය නම් කරන්න.

(b) B අක්ෂරය සඳහන් ස්ථානය නම් කරන්න. (ල:2)

(2) ලෝකයේ මහද්වීප තටක තුනක් ලියා එයට අයත් දූපත් එක බැගින් ලියන්න. (ල:3)

(3) කිසියම් රටක් දූපතක් ලෙස පිහිටීමේ වාසි තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල:5)

05. (1) පෘථිවි ගෝලය මත ව්‍යාප්තව ඇති සාගර අගාධ දෙකක් ලියන්න. (ල:2)

(2) (a) සම්පූර්ණයෙන් ගොඩබිමෙන් වටවූ මුහුදක් ද?

(b) අර්ධ වශයෙන් ගොඩබිමෙන් වටවූ මුහුදු දෙකක් ද ලියන්න. (ල:3)

(3) සාගර හා මුහුදු මිනිස් සම්පතක් ලෙස මිනිසාට ප්‍රයෝජනවත් වන අවස්ථා තුනක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල:5)

06. (1) සානුවක් යනු කුමක්ද? (ල:2)

(2) (a) මහ බාධක කඳුවැටිය පිහිටි රට කුමක්ද?

(b) ශ්‍රී ලංකාවේ ඇති සානු දෙකක් ලියන්න. (ල:3)

(3) නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල:5)

07. (1) ලෝක මට්ටමින් පුළුල් දේශගුණ වර්ගීකරණයක් ඉදිරිපත් කළ දේශගුණ විද්වතුන් දෙදෙනෙකු නම් කරන්න. (ල:2)

(2) යාබද රූපයේ දැක්වෙන A,B,C දේශගුණික කලාප නම් කරන්න. (ල:3)

(3) නිවර්තන දේශගුණයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල:5)




papers.lk

papers.lk